කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# තල් සංවර්ධන මණ්ඩලය

## පුරප්පාඩු

**තල් සංවර්ධන මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 1. කළමනාකරු (මූල්‍ය) MM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්;**

**බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3);**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය / මූල්‍ය / ව්‍යාපාර පරිපාලන විශේෂ මූලික උපාධියක් සහ පිළිගත් වෘත්තීමය ගිණුම්කරණ මණ්ඩලයක අන්තර්මාධ්‍ය සුදුසුකමක් ලබා තිබීම.

2) වෘත්තීය ගිණුම්කරණ මණ්ඩලයක ආශ්‍රිත සාමාජිකත්වය (ICASL, CIMA UK, ACCA සහ CMA හෝ ඊට සමාන)

3) ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාලයෙන් හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙන් ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ පිළිගත් වෘත්තීය ගිණුම්කරණ මණ්ඩලයක අන්තර්මාධ්‍ය සුදුසුකම ලබා තිබීම.

සහ

4) සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් වෙළඳ ආයතනයක විධායක කළමනාකාරිත්ව මට්ටමේ ගිණුම්කරණ / විගණන ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නොඅඩු පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2);**

1) ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.

2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කණිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

වයස අවු. 22 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය, කාර්යක්ෂමතා කඩඉම සහ රැකියා ව්‍යුහය**

සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය සහ වැටුප් කේතය
MM 1-1, 2016, (රු. 53,175 - 10 x 1,375 – 15 x 1,910 – 95,575)

**පොදු**

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු යහපත් ශාරීරිකව සහ මානසික තත්ත්වයකින් හෙබි විය යුතුය.
- අයදුම්කරු යාපනය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුයි.

අයදුම්කරුවන් තම අත්සන යෙදූ අයදුම්පත්‍ර, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, වෙනත් අදාළ සහතික යනාදියේ පිටපත් සහ සාක්ෂාත් කර දෙකක් (ඉන් එකක් ග්‍රාමනිලධාරීවරයාගෙන් ලබාගත යුතුය.) සහිතව ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංක සහිතව;

සියලුම අයදුම්පත්‍ර **2024.01.23** වන දින හෝ ඊදිනට පෙර **"සභාපති, තල් සංවර්ධන මණ්ඩලය, නො. 498, ගාලු පාර, කොළඹ 06"** යන ලිපිනයට, අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතික පිටපත් රහිත සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තම අයදුම්පත්‍ර ඔවුන්ගේ ප්‍රධානීන් මගින් එවිය යුතු ය. පිටපතක් සෘජුවම එවිය යුතු ය.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනම් ඒ සම්බන්ධව බඳවාගැනීමේ බලධරයා විසින් තීරණය කරනු ලැබේ. මේ සම්බන්ධව කිසියම් බලපෑමක් කිරීම නුසුදුසුවීමට හේතු වනු ඇත.

**සභාපති,**
**තල් සංවර්ධන මණ්ඩලය,**
**නො. 498, ගාලු පාර,**
**කොළඹ 06.**